# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,785/22 - 2012 නොවැම්බර් 21 වැනි බදාදා - 2012.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 VIII.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) (ආ) වන උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) (ආ) උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් "ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ්" ආයතනය විසින් 2000 ඔක්තෝබර් මස 17 වැනි දින හා අංක 1154/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද හා එකී පනතේ 25 අ වගන්තිය මගින් සාදන ලද නියමය අවසන් වරට සංශෝධනය කරමින් 2011 නොවැම්බර් මස 22 වැනි දින හා අංක 1733/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයේ "මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිරිනැමීමට ඉඩකඩ සලස්වාලමින් තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර පරිපාලනය විෂයයෙන් උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා, එකී ආයතනය උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් මේ නියමය මගින් පිළිගනිමි" යන වචනය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිරිනැමීමට ඉඩකඩ සලස්වාලමින් තොරතුරු තාක්ෂණයෙහි, ව්‍යාපාර පරිපාලනයෙහි සහ ඉංජිනේරු ශිල්පයෙහි උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා, එකී ආයතනය උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් මේ නියමය මගින් පිළිගනිමි.

**උපලේඛනය**

| | *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|
| | *උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා යොදනු ලබන කෙටි යෙදුම්* | *ක්‍රියාත්මක වන දිනය* |
| 1. | තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | (I) බීඑස්සී (අයිටී) ගෞරව එස්එල්අයිඅයිටී BSc(IT) Hons SLIIT<br>(II) බීඑස්සී(අයිටී) එස්එල්අයිඅයිටී BSc(IT) SLIIT | 2000.10.13 |

උපලේඛනය (අනුබද්ධිතයි)

| | *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|
| | *උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා* | *උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා යොදනු ලබන කෙටි යෙදුම්* | *ක්‍රියාත්මක වන දිනය* |
| 2. | තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (අයිටී) එස්එල්අයිඅයිටී MSc(IT) SLIIT | 2004.03.30 |
| 3. | තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (අයිඑස්) එස්එල්අයිඅයිටී MSc(IS) SLIIT | |
| 4. | තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (අයිඑම්) එස්එල්අයිඅයිටී MSc(IM) SLIIT | |
| 5. | තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පීජීඩිප් (අයිටී) එස්එල්අයිඅයිටී PGDip (IT) SLIIT | 2004.03.30 |
| 6. | තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පීජීඩිප් (අයිඑස්) එස්එල්අයිඅයිටී PGDip (IS) SLIIT | |
| 7. | තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පීජීඩිප් (අයිඑම්) එස්එල්අයිඅයිටී PGDip (IM) SLIIT | |
| 8. | ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) (ගෞරව) උපාධිය | බීබීඒ ගෞරව එස්එල්අයිඅයිටී BBA Hons SLIIT | 2011.06.23 |
| 9. | විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | බීඑස්සී ඉංජිනේරු ගෞරව එස්එල්අයිඅයිටී BSc Eng Hons SLIIT | |
| 10. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය | බීඑස්සී ඉංජිනේරු ගෞරව එස්එල්අයිඅයිටී BSc Eng Hons SLIIT | 2012.07.04” |
| 11. | සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | බීඑස්සී ඉංජිනේරු ගෞරව එස්එල්අයිඅයිටී BSc Eng Hons SLIIT | |
| 12. | ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | බීඑස්සී ඉංජිනේරු ගෞරව එස්එල්අයිඅයිටී BSc Eng (Hons) SLIIT | |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

12-113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.